ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ ආගමික නිදහසට එල්ල වී ඇති තර්ජනයන් පිළිබඳව අන්තර් ජාතික ආගමික නිදහස පිළිබඳ එක්සත් ජනපද කොමිසමේ (USCIRF) බලවත් අවධානය දිගින් දිගටම යොමුවෙමින් පවතී. පසුගිය වසර තුළ බොදු බල සේනා සහ සිංහල රාවය වැනි බෞද්ධ ජාතිකවාදී කණ්ඩායම්වලට අනුයුක්ත බෞද්ධ භික්ෂූණ් සහ ගිහියන් විසින් මුස්ලිම්, හින්දු සහ ක්‍රිස්තියානි ඇතුළු සුළු ආගමික ප්‍රජාවන්ට එරෙහිව ප්‍රහාර ගණනාවක් දියත් කර ඇත. මීට අමතරව, රජයේ නිලධාරීන් සහ පොලිසිය ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් නැවැත්වීමට පියවර නොගත් බවටත්, ඇතැම් අවස්ථාවලදී ඔවුනුත් ඒවාට සහභාගි වූ බවටත්, සුළු ආගමික ප්‍රජාවන්ට ප්‍රමාණවත් ආරක්ෂාව සැලසුවේ නැති බටවත්, එපමණක් නොව සිය ආගමික පූජා භූමි තුළදී සුළු ආගමිකයන්ට හිරිහැර පවා කළ බවටත් අන්තර් ජාතික ආගමික නිදහස පිළිබඳ එක්සත් ජනපද කොමිසමට වාර්තා බොහෝ ගණනක් ලැබී තිබේ. USCIRF 2006 සහ 2010 කාලය තුළ ශ්‍රී ලංකාව පිළිබඳ තම අධීක්ෂණයන් වාර්තා කර ඇත. නමුත් ශ්‍රී ලංකාව සුවිශේෂී අවධානයට ලක් වූ රටක් හෝ තෙවන ස්ථරයේ රටක් හෝ වූයේ නැත.

**පසුබිම** - ශ්‍රී ලංකාව 2009 දක්වාම, රජයේ හමුදා සහ ස්වාධීන රාජ්‍යයක් වෙනුවෙන් සටන් වැදි වාර්ගික පදනමක් මත බිහි වුණු කණ්ඩායමක් වූ දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්. ටී. ටී. ඊ) අතර ඇවිලුණු යුද්ධයකට ගොදුරු වී තිබුණි. යුද්ධය අතරතුරදී සිංහල බෞද්ධයන්, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගමිකයන් සම්බන්ධ වූ වාර්ගික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වැළැක්වීමට හෝ නැවැත්වීමට පියවර ගැනීමට දෙපාර්ශවයම අසමත් වූහ. ශ්‍රී ලංකා රජය සහ එල්. ටී. ටී. ඊ ය විසින් සිදුකළායැයි කියන යුද අපරාධ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් සිදු කරන්නට ඉඩ ලබා දෙන්නැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එක්සත් ජනපදය ශ්‍රී ලංකා ආණ්ඩුවට නැවත නැවතත් කියා තිබේ. සිවිල් යුද්ධයේ දේශපාලන විපාක සහ යුධ අපරාධ පිළිබඳ චෝදනා දිගින් දිගටම ආගමික සහ වාර්ගික ආතතිය තීව්‍ර කරමින් තිබේ.

**සුළු ආගමිකයන්ට එරෙහි එදිරිවාදිකම්** - බොදු බල සේනා සංවිධානය නිරන්තරයෙන්ම සුළු ආගමිකයන්ට එරෙහිව පරිභවාත්මක ප්‍රකාශ සිදු කරයි. එය මුස්ලිම් ආගමිකයන් හිස් ආවරණය පැළඳීම සහ හලාල් සත්ත්ව ඝාතනය තහනම් කරන්නැයි කියා සිටියි. සුළු ආගමිකයන් සමග වෙළදාම් නොකරන්නැයි බෞද්ධයන්ට පෙළඹවීම් කරයි. ආගමට හරවාගැනීමට එරෙහි පනත බලාත්මක කරන්නැයි ඉල්ලා සිටියි. බෞද්ධ භික්ෂූණ් සහ ගිහියන් ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම බොදු බල සේනාවේ ප්‍රතිපත්තිය බව රාජ්‍ය නොවන සංවිධාන සහ නොයෙකුත් ආගමික ප්‍රජාවෝ ස්ථිර ලෙසම ප්‍රකාශ කර සිටිති. වාර්තා වන ආකාරයට බොදු බල සේනා සංවිධානයට රජය සමග සමීප දේශපාලන සහ මූල්‍ය සම්බන්ධතා ඇත. 2013 මාර්තුවේදී බොදු බල සේනා සංවිධානයේ පුහුණු පාසලක් විවෘත කිරීමේ උත්වයට සහභාගි වෙමින් රාජ්‍ය ආරක්ෂක ලේකම්, ශ්‍රී ලංකා ජනාධිපති සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ '' අපේ රටත් ආගමත් වර්ගයත් ආරක්ෂා කරන්නේ බෞද්ධ භික්ෂූණ්ය'' යැයි කියා සිටියේය.

**උත්සන්නවන ප්‍රචණ්ඩත්වය** - පසුගිය වාර්තා වසර තුළ සුළු ආගමිකයන්ට එරෙහි ප්‍රහාර දුසිම් ගණනක් සිදු වී ඇති අතර ඒවා සම්බන්ධව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හෝ නඩු පැවරීම හෝ සිදු වී ඇත්තේ ඉතා කලාතුරකිනි. උදාහරණයක් වශයෙන්, 2013 අගෝස්තු මාසයේ දින දෙකක් තුළදී, මුස්ලිම් ආගමිකයන් රාමසාන් නිමාව සමරමින් සිටිද්දී බෞද්ධ භික්ෂූහු සහ ගිහියෝ විශාල පිරිසක් කොළඹ ග්‍රෑන්ඩ්පාස් පල්ලියට සහ අවට මුස්ලිම් ගෙවල්වලට පහර දුන්හ. මේ සිදුවීමෙන් පුද්ගලයෝ සිවු දෙනෙක් බරපතල තුවාල ලැබූහ. වාර්තා වන ආකාරයට සිද්ධිය පිළිබඳ අනතුරු ඇඟවීමක් ප්‍රදේශයේ පොලීසියට කල් තියා කරනු ලැබ තිබූ නමුත්, පොලීසිය අදාළ ස්ථානයට පැමිණියේ සිදුවීමෙන් පසුවයි. මේ හා සම්බන්ධව කිසිවෙකුත් අත්අඩංගුවට ගත් බවක් වාර්තා වී නැත. වාර්තා වන පරිදි, දිගින් දිගටම සිදුවන හිරිහැර සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයන් මග හැරීමට පල්ලිය වසා දැමීමට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය එකඟ වී ඇත. මේ සිද්ධිය පිළිබඳ වීඩියෝ දර්ශන අන්තර්ජාලයේ ප්‍රසිද්ධියේ ඇත. 2014 ජනවාරි මසදී හික්කඩුවේ දේව හමුවට සහ කල්වාරි පල්ලිවලට එල්ල කළ මැර ප්‍රහාරවල වීඩියෝ දර්ශනත් අන්තර්ජාලයේ ඇත. මේ අවස්ථාවේදීත්, පොලීසියට සිද්ධිය පිළිබඳ කලින් අනතුරු ඇඟවීම් කර තිබී ඇතත්, පොලිසිය එතැනට පැමිණ ඇත්තේ ප්‍රහාරය නිමා වූ පසුවයි. බෞද්ධ භික්ෂූණ් වහන්සේලා 7 දෙනෙක් ඇතුළු පුද්ගලයෝ 18 දෙනෙක් අත්අඩංගුවට ගනු ලැබූහ. ඒ සියලු දෙනාටම නඩුව විසඳෙන තෙක් ඇප ලබා දුනි. නඩු දිනයක් නියම කර ඇත්ද යන්න දැනගන්නට නැත.

**නිර්දේශ** - සිවිල් යුද්ධය නිමා වූ දා සිට, අන්තර් වාර්ගික සමගි සන්ධානය සහ පශ්චාත් ගැටුම් මානුෂවාදී ප්‍රයත්නයන් වෙනුවෙන් එක්සත් ජනපදය සිය සහයෝගය ලබා දී ඇත. ශ්‍රී ලංකා රජය සමග එක්ව කටයුතු කරමින් පහත දැක්වෙන අරමුණු ඉටු කර ගැනීමට එක්සත් ජනපදය ක්‍රියා කළ යුතු බවට අන්තර් ජාතික ආගමික නිදහස පිළිබඳ එක්සත් ජනපද කොමිසම නිර්දේශ කර සිටියි :

2009 වසරේ සිදුවුණායැයි කියන යුද අපරාධ පිළිබඳ පාරදෘශ්‍ය ස්වාධීන පරීක්ෂණයක් සඳහා ඉඩ ලබා දෙන්නැයි ශ්‍රී ලංකා රජයට බලපෑම් කිරීම (මේ චෝදනා සුළු ආගමිකයන්ට එරෙහිව ඉලක්ක කෙරෙන ප්‍රහාර වලට බලපාන බැවිනි) ; ශ්‍රී ලංකාවට ලබාදෙන මානුෂික ආධාර වලින් කොටසක් ආගමික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ හෝ එසේ ගොදුරු වීමට ඉඩ ඇති ආගමික සහ වාර්ගික සුළු ප්‍රජාවන්ට උපකාර කිරීම වෙනුවෙන් යෙදවෙන බව තහවුරු කිරීම; ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ විනිශ්චයකරුවන්ට අන්තර්ජාතික ආගමික නිදහස පිළිබඳ ප්‍රමිතීන් සහ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වූ විට ඒවා විමර්ශනය කිරීම සහ සාධාරණ ලෙස නඩු විභාග කිරීම සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීම; සහ ආගමික ප්‍රචණ්ඩත්වයන් සහ හිරිහැර කිරීම් නිරන්තරයෙන් සහ ප්‍රසිද්ධියේ හෙළා දකින ලෙස රජයේ නිලධාරීන් පෙළඹවීම.

-